**News Release**

UNITED NATIONS HUMAN RIGHTS
OFFICE OF THE HIGH COMMISSIONER

# දශක ගණනාවක් පුරා සිදු කර ඇති බලහත්කාරයෙන් අතුරුදන් කිරීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව වගවීම සහතික කළ යුතුයි - - එක්සත් ජාතීන්ගේ වාර්තාව

ජිනීවා (2024 මැයි 17) - දශක ගණනාවක් පුරා බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට ලක් වූ දස දහස් ගණනක් පුද්ගලයන්ගේ ඉරණම සහ ඔවුන් සිටින ස්ථානය හෙළි කිරීමට සහ එම අපරාධ වලට වගකිව යුත්තන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගත යුතු බව අද දින නිකුත් වූ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාලයේ වාර්තාව පවසයි.

මෙම අපරාධ සම්බන්ධයෙන්, රාජ්‍ය ආරක්ෂක අංශ හා අනුබද්ධ සන්නද්ධ කණ්ඩායම්වල මැදිහත්වීම පිළිගෙන, ප්‍රසිද්ධ සමාවක් අයද සිටින ලෙස එම වාර්තාව තව දුරටත් රජයෙන් ඉල්ලා සිටියි.

"බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට ලක් වූ සියලු ශ්‍රී ලාංකිකයන් කිසිදා අමතක නොකළ යුතු යැයි මෙම වාර්තාව නැවතත් තහවුරු කරන" බව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් වොල්කර් ටර්ක් මහතා පැවසීය. "ඔවුන්ගේ ඥාතීන් හිතමිතුරන් බොහෝ කා ලයක් බලා සිටින අතර ඔවුන්ට සත්‍යය දැනගැනීමට අයිතියක් ඇත."

"බලහත්කාරයෙන් අතුරුදහන් වූ සියලු දෙනා කෙරෙහි යුක්තිය ඉටු කිරීමට ලාංකීය රජය බැඳී සිටියි. මෙම අපරාධ පිළිබඳව පූර්ණ විමර්ශනයක් සිදු කිරීම ඉතාමත් වැදගත්ය. මෙවැනි අපරාධ බලහත්කාරයෙන් අතුරුදහන් කලවූවන්ගේ ආදරණීයයන් පමණක් නොව සියලු ප්‍රජාවන් සහ මුළු මහත් ශ්‍රී ලාංකීය සමාජයම දිගින් දිගටම කම්පනයට ලක් කරනු ඇත."

නොයෙකුත් රජයන් විසින්, බලහත්කාර අතුරුදහන්වීම්වලින් සියලු පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය සම්මත කිරීම, අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය සහ හානිපූරණය සඳහා වන කාර්යාලය පිහිටුවීම වැනි විධිමත් පියවර කිහිපයක් ගෙන ඇති නමුත්, තනි පුද්ගල අතුරුදහන් වීම් පුළුල් ලෙස විමර්ශනය කොට විසඳීම කෙරෙහි ගෙන ඇති ප්‍රායෝගික පියවර සීමිත බව මෙම වාර්තාව පෙන්වා දෙනු ලැබේ.

නොයෙකුත් රජයන් විසින්, බලහත්කාර අතුරුදහන්වීම්වලින් සියලු පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය සම්මත කිරීම, අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය සහ හානිපූරණය සඳහා වන කාර්යාලය පිහිටුවීම වැනි විධිමත් පියවර කිහිපයක් ගෙන ඇති නමුත්, තනි පුද්ගල අතුරුදහන් වීම් පුළුල් ලෙස විමර්ශනය කොට විසඳීම කෙරෙහි ගෙන ඇති ප්‍රායෝගික පියවර සීමිත බව මෙම වාර්තාව පෙන්වා දෙනු ලැබේ.

1970 සහ 2009 අතර කාලයේදී පුළුල්ව සිදුවූ බලහත්කාර අතුරුදහන් කිරීම් මූලික වශයෙන් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා සහ අනුබද්ධ සන්නද්ධ කණ්ඩායම් විසින් සිදු කරන ලදී. දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය ද පැහැරගැනීම්වල නිරත වූ අතර, එම පැහැරගැනීම්

"බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලට සමාන" බව බලහත්කාරයෙන් හෝ අනිච්ඡානුග අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම *(UN Working Group on Enforced and Involuntary Disappearances)* පවසා ඇත.

බලහත්කාරයෙන් අතුරුදහන් වූවන්ගේ පවුල්වලට, විශේෂයෙන්ම කාන්තාවන්ට, මෙම අපරාධය නිසා සිදුවන මානසික, සමාජීය සහ ආර්ථික බලපෑම පිළිබඳව, තනි පුද්ගලයන් සමග සහ සාමූහික පිරිස් සමග කල සම්මුඛ සාකච්ඡා මත පදනම් වූ මෙම වාර්තාව විස්තර කරනු ලැබේ. අතුරුදහන් වූවන්ගෙන් බහුතරය පුරුෂයන් වන නිසා, බොහෝ විට පවුලක එකම ආදායම් උපයන්නිය බවට කාන්තාවන් පත් වී ඇත. මෙම කාන්තාවන් හට තම ජීවනෝපාය සලසා ගැනීමට සිදුවී ඇත්තේ, කාන්තා සහභාගිත්වයට බාධා ඇති සහ ලිංගික අතවර ආදී නොයෙකුත් හිරිහැර සහිත වාතාවරණයක් තුළය. අතුරුදහන් වූවන් සෙවීමේ ව්‍යාපාරවල පෙරමුණ ගත් බොහෝ කාන්තාවන්, හමුදාව සහ පොලිසිය විසින් තර්ජන හා හිරිහැර කිරීම්, බිය ගැන්වීම්, සෝදිසි කිරීම්, අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම්, පහර දීම් සහ වධහිංසා පැමිණවීම් ඇතුළු උල්ලංඝනයන්ට ලක්වී ඇති බව එම වාර්තාවේ වැඩිදුරටත් සඳහන් වේ.

බලහත්කාරයෙන් අතුරුදහන් වූවෙක් පිළිබඳව තවමත් සොයමින් සිටින කාන්තාවක් පැවසුවේ: "මම මේ කටයුතු දිගටම කරගෙන ගියහොත්, මාගේ ස්වාමිපුරුෂයාව කෑලි කෑලි වලට කපන බව සහ මාගේ දරුවන්ට හිරිහැර කරන බවත්, ඔවුන් මට දැනුම් දුන්නා"" යැයි කියාය.

ජාත්‍යන්තර නීතිය අනුව අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ ඉරණම හෝ රඳවා සිටින ස්ථානය නිශ්චිත කරන තෙක්, බලහත්කාරයෙන් පැහැර ගැනීමේ අපරාධය අඛණ්ඩ උල්ලංඝනයක් ලෙස සලකන බව සහ එවැනි අතුරුදහන්වීම් විසඳීමට රාජ්‍ය බැඳී සිටින බව, මහ කොමසාරිස්වරයා පැවසීය.

එහෙත්, බොහෝ වින්දිත පවුල්වලට එවැනි පිළියමක් ලැබී නොමැත.

"සති දෙකක් ගත විය, පසුව මාස දෙකක් ගත විය, ඉන් පසුව අවුරුදු දෙකක් ගත විය. දැන් වසර 32ක් ගතවී ඇත, මම තවමත් බලා සිටිමි," යනුවෙන් ජාතික විමර්ශන කොමිසමක් ඉදිරියේ, තම පුතාගේ අතුරුදහන් වීම සම්බන්ධව සාක්ෂි දුන් පුද්ගලයකු පැවසීය.

රජයන් විසින් නොයෙකුත් විමර්ශන කොමිෂන් සභා පත් කල ද, මේ බොහොමයකගේ වාර්තාවන් ජනගත කර නොමැති අතර, ඒවා ප්‍රසිද්ධ කල අවස්ථා වලදී පවා ඒවායෙන් තොරතුරු දැන ගැනීම බොහෝ විට සීමා කර ඇත. මෙම වාර්තාවල තිබූ බොහෝමයක් නිර්දේශ, විශේෂයෙන්ම අපරාධ වලට වගවීම පිළිබඳව ඇති නිර්දේශ, ක්‍රියාත්මක කර නැත. වත්මන් සහ හිටපු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් ඇතුළු චෝදනා එල්ල වූවන් යුක්තිය මගහරිමින් සිටිති.

යුද්ධය අවසන් වී 15 වසරක් ගත වී, ඊට පෙර සිදුවූ බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම් ද සිදුවී දශක ගණනාවක් ගත වී ඇතත්, තවමත් මෙම අපරාධ පිළිබඳ ව යුක්තිය සහ වගවීම ඉටු කිරීමට ශ්‍රී ලාංකික බලධාරීන් අපොහොසත් වී ඇත.

"වගවීම සඳහා ක්‍රියාමාර්ගයන් ගත යුතුය. සංහිඳියාව සාර්ථක වීමට නම්, ආයතනික ප්‍රතිසංවිධාන සිදුවිය යුතු" බව ටර්ක් මහතා පැවසීය.

අවසන්.